රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் அமைச்சு
Ministry of Public Administration, Home Affairs and Provincial Councils & Local Government

ස්වදේශ කටයුතු අංශය (ප්‍රාදේශීය පාලන) | உள்நாட்டலுவல்கள் பிரிவு (பிரதேச நிர்வாக்) | Home Affairs Division (Divisional Administration)

මගේ අංකය / எனது இல / My No: HA/ 02/ 26/ 05/ 01 (තාවකාලික)    ඔබේ අංකය / உமது இல / Your No:    දිනය / திகதி / Date: 2020.07.16

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන ශක්තිමත් කිරීම</u>**
**<u>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයීය ස්වදේශ කටයුතු අංශය මගින් මෙහෙයවන වෙබ් සමුළු මාලාව (Webinar Series)</u>**

අප රටතුල කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කරගැනීමට සහ ඇදිරි නීතිය පැවති කාලය තුලදී මහජනයාට එදිනෙදා ජන ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය සහන සේවාවන් සැපයීමට, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මූලික කොටගත් රාජ්‍ය යාන්ත්‍රණය තුලින් විශාල සහයක් ලැබිණ. වසංගතය පැතිරීමේ අරම්භයත් සමග දින කීපයක් තුලදි සක්‍රිය සේවාවක් සැපයීමට පෙළ ගැස්ම සහ වසංගත තත්වය හමුවේ තම සේවාවන් ප්‍රජාව වෙත සපයාදීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සෑම මට්ටමකම කාර්ය මණ්ඩල විසින් ලබා දෙන ලද දායකත්වය මගින් රාජ්‍ය සේවාව රට තුල සක්‍රියව ක්‍රියාත්මක වන බවට කදිම ආදර්ශයක් ලබාදෙනු ලැබිණ. පැවති දුෂ්කරතා පසෙක තබමින් සාමූහිකව සෙසු රාජ්‍ය සේවාවන් සමග අත්වැල් බැඳ ගනිමින් අභියෝග ජය ගැනීමට ඉදිරිපත් වූ ඔබ සියළු දෙනා ද ඔබගේ සහය කාර්යය මණ්ඩලවල සියළුම නිලධාරීන් ද වෙත මාගේ කෘතවේදීත්වය පිරිනමමි.

ඔබගේ සහ ඔබ කාර්යය මණ්ඩලවල සහාය පශ්චාත් වසංගත සමයේ අඩාල වූ ජන ජීවිතය සහ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමට අත්‍යාවශ්‍ය වන්නේය. ඔබ කාර්යාල තුලින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් ක්‍රමවත්ව පෙල ගැස්මකින්, ඒකීය භාවයකින් යුතුව රට පුරා ක්‍රියාත්මක කිරීමේ වැදගත් කම රජය මගින් අවබෝධ කරගෙන ඇත. එහිදී, ඔබ කාර්යය මණ්ඩල පසුගිය මාස 4 - 5ක කාලයක් තුල ක්‍රියාත්මක වීමෙදී ලද අත්දැකීම් හා මුහුණ පෑ අභියෝග පාදක කර ගනිමින් ආර්ථික හා සමාජීය වශයෙන් වඩාත් ශක්තිමත් රටක් බිහි කිරීමට අවශ්‍ය සේවාවන්හි ගුණාත්මක භාවය වැඩි දියුණු කර ගැනීම සහ වෘත්තීය සංවර්ධනය ඉවහල් වන ආකාරයට වෙබ් සමුළු (On line seminar -webinar) මාලාවක් අන්තර් ජාල පහසුකම් යොදා ගනිමින් පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් යෝජනා කරනු ලැබ ඇත. එම වෙබ් සමුළු සංවිධානය කිරීම හා තාක්ෂණික සේවාවන් සැපයීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සිදු කරනු ඇත. ඒ අනුව අප අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය විසින් සම්බන්ධිකරණය හා මෙහෙයවීමේ වගකීම දරනු ඇත. ඊට අවශ්‍ය නායකත්වය සහ පහසුකම් සලසා දීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය විසින් දරනු ඇත.

මේ සමග අමුණා ඇති පත්‍රිකාවේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරමින් එම වෙබ් සමුළු අන්තර්ගතය, ඔබ කාර්යාලයේ කාර්යය සාධන හා පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීමටත්, කාර්යය මණ්ඩලවල වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කර ගැනීමටත්, යොදා ගන්නා ලෙස මෙයින් කරුණාවෙන් දන්වමි.

ජේ.ජේ රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


රාජ්‍ය පරිපාලන අංශය
பொது நிர்வாக பிரிவு
Public Administration Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
சுதந்திர சதுக்கம், கொழும்பு 07.
Independance Square, Colombo 07.
TP : +94 112 166 000/+94 112 696 211 - 13
Fax : 94 112 695 279
Email: info@pubad.gov.lk
Web : www.pubad.gov.lk

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division
"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05.
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.
TP : +94 115 999 631 / +94 115 924 854
Fax : +94 112 369 047
Email: divadmin@moha.gov.lk
Web : www.moha.gov.lk

පළාත් සභා හා පළාත් පාලන අංශය
மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் பிரிவு
Provincial Councils & Local Government Division
330, යූනියන් පෙදෙස, කොළඹ 02.
330, யூனியன் பிளேஸ்,கொழும்பு 02.
330, Union Place, Colombo 02.
TP : +94 112 305 326/7 or +94 112 303 280
Fax : +94 112 347 529
Email: secretary@pclg.gov.lk
Web : www.pclg.gov.lk

ඇමුණුම II

<u>වෙබ් සමුලුසඳහා මයික්‍රොසොෆ්ට් ටීම්ස් (MS Teams)භාවිතාකිරීම.</u>

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය මෙහෙයවීමෙන් පවත්වනු ලබන මෙම වෙබ් සමුලු වලට සහභාගි වීමට අන්තර්ජාල පහසුකම් සහිත පරිගණකයක් හෝ ස්මාර්ට් දුරකථනයක් භාවිතා කළ හැක. වෙබ් සමුලු විකාශනය කිරීම සඳහා මයික්‍රොසොෆ්ට් ටීම්ස් (Microsoft Teams) මෘදුකාංගය භාවිතා කෙරේ.මයික්‍රොසොෆ්ට් ටීම්ස් යනු දුරස්ථ ඉගෙනුම් කටයුතු සඳහා විශේෂයෙන් සැකසූ මෘදුකාංගයකි. එය ඩෙස්ක්ටොප් පරිගණකයක් සමඟහෝ ලැප්ටොප් පරිගණකයක් සමඟ, ටැබ්ලට් පරිගණකයක් සමඟ හෝ ජංගම දුරකථනයක් සමඟ හොඳින් ක්‍රියා කරවිය හැක. වෙබ් සමුලුවට සම්බන්ධ වීමට නම්ඔබගේ පරිගණකයේ හෝ ජංගම දුරකථනයට මයික්‍රොසොෆ්ට් ටීම්ස් මෘදුකාංගය ස්ථාපනය කර ගත යුතුය.

මයික්‍රොසොෆ්ට් ටීම්ස් මෘදුකාංගයඩවුන්ලෝඩ් කර ගැනීමට මෙම වෙබ් ලිපිනයට පිවිසෙන්න.

https://www.microsoft.com/en/microsoft-365/microsoft-teams/download-app




ඔබ ඩෙස්ක්ටොප්පරිගණකයක් හෝ ලැප්ටොප් පරිගණකයක් භාවිතා කරන්නේ නම් Download for Desktop බටින් එක ක්ලික් කර ඩෙස්ක්ටොප් ඇප් එක ඩවුන්ලෝඩ් කර පරිගණකයේ ස්ථාපනය කර ගන්න.

ඔබ ජංගම දුරකථනයක් භාවිතා කරන්නේ නම් ඉහත වෙබ් අඩවියේ ඇති Download for Mobileබටින් එක ක්ලික් කර මොබයිල් ඇප් එක ඩවුන්ලෝඩ් කර ගත හැක. නැතිනම් App Store/ Play Store හරහා සර්ච් කර මොබයිල් ඇප් එක ලබා ගන්න. එය පරිගණකයේ හෝ ජංගම දුරකථනයේ ස්ථාපනය කර ගත් පසුමෙවැනි අයිකන් එකක් දැකිය හැක.




එය ඩබල් ක්ලික් කරන්න. එවිට මෙවැනි වින්ඩෝවක් ලැබෙනු ඇති.




එහි රතු පැහැයෙන් කොටු කර ඇති ටෙක්ස්ට් බොක්ස් එකෙහි ඔබට ලබා දී ඇති ප්‍රවේශ නාමය (User Name) ඇතුළත් කර Sign in බටින් එක ක්ලික් කරන්න. ඔබට මෙවැනි වින්ඩෝවක් ලැබෙනු ඇත.




දැන් ඔබට ලබා දී ඇති මුරපදය (Password) ඇතුළත් කර Sign in බටින් එක ක්ලික් කරන්න.

කරන්න. ඔබගේ මයික්‍රොසොෆ්ට් ගිණුමේ මුර පදය වෙනස් කර ගැනීමට හැකි වන සේ මෙවැනි වින්ඩෝවක් ලැබෙනු ඇත.




එහි Current password යන ස්ථානයට ඉහත වගුවේ දක්වා ඇති මුර පදයද, New password යන ස්ථානයට අළුත් මුරපදයක් ද, Confirm password යන ස්ථානයට ඔබ ඇතුළත් කළ නව මුරපදය නැවත ඇතුළත් කරන්න.මුර පදයක් සැකසීමේදී කැපිටල් අකුරු, සිම්පල් අකුරු සහ විශේෂ සේතයන් 8ක් ඇතුළත් විය යුතු බව මතකයේ තබා ගන්න. එයද ඇතුළත් කර ඇතුළත් කර Sign in බටන් එක ක්ලික් කරන්න. මෙලෙස වීම් ඇපු එක භාවිතට සුදුසු ලෙස සැකසී ඔබට දිස්වනු ඇත.




## වෙබ් සමුලුවකට සහභාගි වීම

වම්පස ඇති අයිකන් අතරින් Calendar අයිකන් ඒක ක්ලික් කරන්න. කැලැන්ඩරයේ ඔබගේ රැස්වීම් යාවත්කාලීන වී ඇති බැව් දැකිය හැකි වනු ඇත. ඒ අතරින් වෙබ් සමුලුවට  අදාල දැන්වීම් කැලැන්ඩරයේ රැස්වීමක් ලෙසසලකුණු වී ඇත. එහි ඇතිJoin යන බටන් එක ක්ලික් කිරීමෙන් රැස්වීමට සම්බන්ධවීමට ප්‍රවේශය සපයනු ඇත.




එවිට ලැබෙන මෙවැනි වින්ඩෝවෙහි ඇතිJoin යන බටන් එක ක්ලික් කරන්න.




දැන් ලැබෙන තිරය වෙබ් සමුලුව පැවැත්වෙන තිරයයි. තිරයේ මධ්‍ය කොටසේ ප්‍රධාන පාලක බටන් ඇත. ඒවා භාවිතා කළ හැකි කාර්යයන් පහත රූපයෙන් දැක්වේ.




මේ සම්බන්ධයෙන් ඔබට මතුවන යම් ගැටලුවක් වේ නම් 1982 දුරකථන අංකය ඔස්සේ තොරතුරු තාක්ෂණ අංශයට යොමුකරන්න.